සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 62 S

නම ..............................................

පුරවැසි අධ්‍යාපනය I - කොටස

කාලය පැය දෙකයි

●සැළකිය යුතුයි:-

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 - 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. පවුල හැරුණ විට සිසුන් යහපත් පුරවැසියන් කිරීමට උපකාරී වන ආයතනය වන්නේ ........................................... යි.
( පාසල/ අතිරේක පංතිය/ ක්‍රීඩා පිටිය/ ළමා සමාජය)

02. පාසලේ ප්‍රධාන පරිපාලන තනතුර වන්නේ .......................................................
(නියෝජ්‍ය විදුහල්පති / විදුහල්පති/ ජ්‍යෙෂ්ඨ අංශ ප්‍රධාන/ ප්‍රධාන ශිෂ්‍ය නායක)

03. පාසලේ සංවිධාන ව්‍යුහයට අයත් නොවන පිරිස වන්නේ ..................................................................... ය.
( ශිෂ්‍ය නායකයන් /ආදි සිසුන් / අනධ්‍යයන කාර්ය මණ්ඩලය / ගුරු මණ්ඩලය)

04. ඔබගේ ජීව දත්ත පත්‍රිකාවේ ඇතුළත් වන්නේ ........................................................... තොරතුරු යි.
(පියා පිළිබඳ / ඔබ පිළිබඳ / විදුහල්පති පිළිබඳ/ පංතිභාර ගුරුතුමිය පිළිබඳ)

05. ................................................................. පාසල් සිසුවකු වශයෙන් ඔබගේ වගකීම කි.
( පාසලේ සම්පත් ආරක්ෂා කිරීම / විනය නීති කඩකිරීම/ ගුරු ඇගයීම් කටයුතු / පෙළපොත් බෙදා දීම)

- අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. උප්පැන්න සහතිකයෙන් ඔබගේ නම නිවැරදි බව තහවුරු කරගත හැකි ය. ( )

07. C.W.W. කන්නන්ගර මැතිතුමා 1947 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභාපතීත්වය දැරී ය. ( )

08. පවුල තුළින් පුද්ගලයෙකුගේ හැකියා හා දක්ෂතා වර්ධනය කරගත හැකි ය. ( )

09. ඉවසීම නැතිකම සාර්ථක පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණයක් වේ. ( )

10. මිතුරන් සමඟ දැනුම හුවමාරු කර ගැනීම තම ඉලක්ක ජයගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේදයකි. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. ඔබේ දක්ෂතා වර්ධනය කර ගැනීම සඳහා කළ යුත්තේ මින් කුමක් ද?
1. අනුන් දෙස බලා සංසන්දනය කිරීම යි.
2. තම දක්ෂතා අවස්ථානුකූලව පෙන්වීම යි.
3. නිහඬව බලා සිටීම යි.
4. පුවත්පත් කියවීම යි.

12. දුර්වලතා අවම කර ගැනීම සඳහා පුද්ගලයෙකු කළ යුත්තේ මින් කුමක් ද?
1. තම දුර්වලතා හඳුනා ගැනීම යි.
2. විරුද්ධවාදීන් පරාජය කිරීම යි.
3. බොරු කීම යි.
4. තර්කානුකූලව කතා කිරීම යි.

13. ළමා මිතුරු පාසල් පරිසරයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. ප්‍රජා සහභාගීත්වය හිඟවීම.
2. ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් පැවතීම.
3. ළමයින්ගේ මූලික හිමිකම් නොමැති වීම.
4. සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් තිබීම.

14. අභියෝග ජය ගැනීම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංගය කි.
1. ආත්ම විශ්වාසය
2. ක්‍රීඩා කටයුතු වල යෙදීම.
3. ගුරුවරුන්ට කීකරු වීම.
4. යහළුවන් සමඟ කටයුතු කිරීම.

15. සැලසුම්කරණය හා සංවිධානය නිසා,
1. ගැටළු උග්‍ර වෙයි.
2. කාලය නාස්ති වෙයි.
3. සිතේ පීඩාකාරී බව අඩුවෙයි.
4. සම්පත් අපතේ යයි.

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**




A

16. A පින්තූරයෙන් දැක්වෙන්නේ ............................................................ මැතිතුමාය.

17. එතුමා බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා ...................................... ලබාදීමට කටයුතු කළේය.

18. ඔහු ........................................................................................ යන විරුදාවලියෙන් හඳුන්වයි.



B

19. B පින්තූරයෙන් දැක්වෙන්නේ ............................................................ මැතිතුමාය.

20. ඔහු ........................................................................................ බිහි කිරීමට පුරෝගාමී විය.


(ල. 2 x 20 = 40 )

# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.**

(01) ඉතිහාසය දැන ගැනීමට උපයෝගී වන සෑම දෙයක්ම මූලාශ්‍ර වේ.
- i. ඔබේ පාසලේ ඉතිහාසය ඉගෙනීමට ඇති මූලාශ්‍ර 2 ක් ලියන්න.
- ii. පාසලක අනන්‍යතාවය පිළිබිඹු කරන සංකේත 2 ක් ලියන්න.
- iii. ඔබේ පාසල අයත් අධ්‍යාපන කොට්ඨාසය හා අධ්‍යාපන කලාපය පිළිවෙලින් ලියන්න.
- iv. පාසල් සිසුවකු ලෙස ඔබගේ කාර්යභාරය ගැන කරුණු 2 ක් ලියන්න.
- v. පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු 2 ක් ලියන්න.
- vi. පාසල් සංස්කෘතියට අයත් අංග 2 ක් ලියන්න.
- vii. පාසල් කොඩිය භාවිතා කරන අවස්ථා 2 ක් ලියන්න.
- viii. ඔබ තුළ පවතින දුර්වලතා 2 ක් ලියන්න. (ල. 2 x 8 = 16)

(02) " ශිෂ්‍යයා පාසලක සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන කොටස්කරුවෙකි."
පහත පාසල් සංවිධාන ව්‍යුහයේ ඇති අවස්ථා සම්පූර්ණ කරන්න.




ii. ඉහත B හි සිටින පුද්ගලයාගේ කාර්යයන් 4 ක් ලියන්න. (ල. 04)

iii. පාසල් සංවිධාන ව්‍යුහයේ ඇති වෙනත් කමිටු 4 ක් ලියන්න. (ල.04)

(03) I. පුද්ගලයෙකුට හැකියා හා දක්ෂතා වැඩිදියුණු කරගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේද 3 ක් ලියන්න. (ල. 03)

ii. පහත වගුව සම්පූර්ණ කරන්න.

| සැලසුමකට වැඩ කිරීමෙන් ලැබෙන වාසි | සැලසුමකට වැඩ නොකිරීමෙන් ලැබෙන අවාසි |
|---|---|
| 1. ............................................. | 1. ............................................. |
| 2. ............................................. | 2. ............................................. |
| 3. ............................................. | 3. ............................................. |
| 4. ............................................. | 4. ............................................. |

(ල. 08)

(04) I. පාසල් සිසුවකු ලෙස ඔබට හිමිවන අයිතිවාසිකම් 4 ක් දක්වා ඒ හා බැඳුණු යුතුකම් ඉදිරියෙන් ලියන්න.

| ඔබ සතු අයිතිවාසිකම් | ඒ හා බැඳුණු යුතුකම් |
|---|---|
| 1. ............................................. | 1. ............................................. |
| 2. ............................................. | 2. ............................................. |
| 3. ............................................. | 3. ............................................. |
| 4. ............................................. | 4. ............................................. |

(ල. 04)


ii. පාසලෙන් ඔබට සපයා ඇති පහසුකම් 4 ක් ලියන්න. (ල. 04)

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

iii. ගුරුවරුන් වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 3 ක් ලියන්න.


1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. .......................................................................................................................................... (ල. 03)

(05) i. පහත දැක්වෙන රූපවල හිස්තැන් පුරවන්න.





(ල.03)

ii. පහත රූප සටහන් සම්පූර්ණ කරන්න.




(ල. 04)

iii.




(ල. 04)

06) පාසලක පවත්නා නීති රීති හා සම්ප්‍රදායන් හඳුනාගෙන නිවැරදිව යා කරන්න.

| නීතිරීති |
|---|

| සම්ප්‍රදායන් |
|---|

1. නිල ඇඳුම ප්‍රමිතියට සකස් කරගැනීම.
2. පාසලේ ආගමික වතාවත් නිවැරදිව ඉටුකිරීම.
3. දිනපතා පාසලට පැමිණීම.
4 නායකත්වයට අවනත වීම.
5. පාසල් කාලය තුළ පාසලේ රැඳී සිටීම.
6. කාල සටහනට අනුව වැඩ කිරීම.
7. පාසල ආරම්භ කිරීමට පෙර පාසලට පැමිණීම.
8. පාසල් ගීය ගායනා කරන විට නිවැරදි ඉරියව් ප්‍රකාශ කිරීම.
9. කාලයක් තුළ පැවත එන සිරිත් විරිත් අනුගමනය කිරීම.
10. ගුරුවරුන්ට ගරු කිරීම
11. සහෝදර සිසුන්ට උපකාර කිරීම.

(07) පහත දැක්වෙන උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

3 - රටක සිටින ජනතාව මේ නමින් හැඳින්වේ.

4 - සිසුන්ගේ සෞන්දර්යාත්මක හැකියා වර්ධනය කරන විෂයකි.

6 - විවිධ අංශ වලින් ඉගෙනුමෙහි නිරත වන දරුවන් පිළිබඳ සංවේදීව කටයුතු කරන අය වේ.

7 - ඔබ තුළ පවතින දුර්වල ගති ලක්ෂණයකි.

11 - පාසලේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමෙන් දරුවන් තුළ මෙම ලක්ෂණය ඇති වේ.

<u>පහළට</u>

1 - මේවා රැකගැනීමේ වැදගත්කම කියාදීම පාසල මගින් අවට ප්‍රජාවට ලබාදෙන පණිවිඩයකි.


2 - පාසලට මෙම පහසුකම රජයෙන් ලබා දේ.

5 - පාසල් කොඩිය එසවීමේ දී හා ගීතය ගායනා කරන විට මෙම ඉරියව්වෙන් සිටිය යුතුය.

8 - ඔබ තුළ පවතින යහපත් ලක්ෂණයකි.

9 - සැලසුම්කරණය හා සංවිධානය නිසා මෙය ඉතිරි වේ.

10- මේවා කියවීමෙන් පුද්ගලයාගේ දැනුම හා හැකියා වැඩිදියුණු කරගත හැකිය.



පළමු වාර පරීක්ෂණය - 2019

06 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය

පිළිතුරු පත්‍රය

# I කොටස

1 - පාසල
2 - විදුහල්පති
3 - අනධ්‍යයන කාර්ය මණ්ඩලය
4 - ඔබ පිළිබඳ
5 - පාසලේ සම්පත් ආරක්ෂා කිරීම

6 - ✓
7 - ✗
8 - ✓
9 - ✗
10 - ✓

11 - තම දක්ෂතා අවස්ථානුකූලව පෙන්වීම.
12 - තම දුර්වලතා හඳුනා ගැනීම
13 - සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් පැවතීම.
14 - ආත්ම විශ්වාසය
15 - සිතේ පීඩාකාරී බව අඩුවෙයි.

16. C. W. W. කන්නන්ගර මහතා
17. නොමිලේ අධ්‍යාපනය
18. නිදහස් අධ්‍යාපනයේ පියා
19. මහාචාර්ය සේනක බිබිලේ මහතා
20. රාජ්‍ය ඔසුසල

# II කොටස

(01) i. සමරු ඵලක, පැරණි ලිපි ලේඛන, පින්තූර පැරණි අයගෙන් ලබා ගන්නා තොරතුරු, පාසලේ පවතින පැරණි ලොග් පොත, ආගමික ස්ථාන වල පවතින තොරතුරු ආදී කරුණු ( කරුණු 2 ලකුණු 2)

ii. ආදර්ශ පාඨය, නිල ලාංඡනය, පාසල් කොඩිය, පාසල් ගීය, නිල ඇඳුම, මෙහෙවර ප්‍රකාශය, දැක්ම ආදී (පිළිතුරු 2 ට ලකුණු 2)

iii. නිවැරදි පිළිතුරට ලකුණු 2 ක්

iv. දිනපතා පාසල් පැමිණීම, හොඳින් ඉගෙන ගැනීම, විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයට ගෞරව කිරීම, විනය නීති රීති සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම ආදී (පිළිතුරු 2 ට ලකුණු 02)

v. පාසල තුළ හොඳ ඉගෙනුම් වාතාවරණයක් ඇති කිරීම. පාසල ක්‍රමවත්ව පාලනය කිරීම, සිසුන් විනයගරුක පුද්ගලයින් කිරීම, සියලු දෙනාගේම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ආදී (පිළිතුරු 2කට ලකුණු 2)

vi. පාසලේ පවතින නීතිරීති, සම්ප්‍රදායන්, සිරිත් විරිත් , සංකේත

vii. උදෑසන රැස්වීම, නිවාසාන්තර ක්‍රීඩා උත්සවය, වෙනත් විශේෂ උත්සව

viii. ඉවසීම නොමැතිකම, කේන්ති යෑම, බොරු කීම, ආවේගශීලී බව, කළහකාරී බව, ආත්මාර්ථකාමී බව ආදී (පිටුව 19)

(02) i. A - ශිෂ්‍යා B. විදුහල්පති C. ගුරුවරු (ල. 03)

ii. අධ්‍යාපන කටයුතු වල නියමුවා ලෙස කටයුතු කිරීම, ළමයින් ඇතුළත් කිරීම, පංති බෙදීම හා ගුරුවරු නම් කිරීම, කාලසටහන සකස් කිරීම, ගුරු සංවර්ධනය, විෂය මාලා ක්‍රියාත්මක කිරීම, ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය. (ල. 04)

iii. පාසල් කළමණාකරන කමිටුව, ක්‍රීඩා කමිටුව, සුබසාධක සංගමය, ශිෂ්‍ය නායක මණ්ඩලය, පරිසර කමිටුව, විනය කමිටුව

(03) i. තම ජීවිත අත්දැකීම්, අන් අයගේ ජීවිත අත්දැකීම්, පවුල තුළින්, සමාජය තුළ පවතින විවිධ වැඩසටහන් මඟින්, මාධ්‍ය මඟින්, ප්‍රවීණයන්ගේ අත්දැකීම් හා දැනුම තුළින් ආදී කරුණු

ii.

| <u>වාසි</u> | <u>අවාසි</u> |
|---|---|
| 1. කාලය ඉතුරු වෙයි | කාලය අපතේ හරී |
| 2. කාර්ය පහසු කරයි. | කාර්ය අතපසු කරයි. |
| 3. සම්පත් පිරිමැසේ | සම්පත් නාස්ති කරයි. |
| 4. ආත්ම විශ්වාසය ඇති වෙයි. | ආත්ම විශ්වාසය නැතිකර ගනී. |
| 5. පීඩාකාරී බව අඩු කරයි. | සිතේ පීඩාව වැඩිවේ. (ල. 08) |

(04) i.

| | |
|---|---|
| අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය | - හොඳින් ඉගෙන ගැනීම |
| දක්ෂතා සංවර්ධනයට ඇති අයිතිය | - දක්ෂතා පෙන්වීමට කටයුතු කිරීම. |
| ආරක්ෂා සහිතව සිටීමට ඇති අයිතිය | - තම ආරක්ෂාව පිළිබඳ දැනුවත් වීම. |
| අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය | - විනයගරුකව අදහස් දැක්වීම. |
| සමාන ලෙස සැලකුම් ලැබීමට ඇති අයිතිය | - සෙසු අය සමඟ සහයෝගයෙන් සිටීම. |

ii. අධ්‍යාපනය, පෙළ පොත්, නිල ඇඳුම්, විද්‍යාගාර පහසුකම්, පුස්තකාල පහසුකම්, පරිගණක පහසුකම් ආදී (ල. 04)

iii. හොඳින් ඉගෙනීමේ කටයුතු වල යෙදීම, අවශ්‍ය අවස්ථාවල උදව් කිරීම හා සහය වීම, අවවාද අනුශාසනා පිළිගැනීම, ආචාරශීලී වීම, ගරු කිරීම හා කීකරු වීම ආදී කරුණු (ල. 03)

(05) i. A - සුබ පතන්නන් B - ආදි සිසුන් C- විවිධ සංවිධාන

ii. ජනතාවගේ සාක්ෂරතාව වැඩි දියුණු කිරීම, අනාගත නායකයන් පුබුදු කිරීම, දරුවන් විනයගරුක පුද්ගලයන් බවට පත්කිරීම, දරුවන්ගේ දක්ෂතා එළි දැක්වීම, ප්‍රජාවට පණිවිඩ ලබාදීම.

iii. පාසල සතු දේපළ ආරක්ෂා කිරීම, පාසල අවට ඇති විවිධ සංවිධාන වලින් සේවා ලබා ගැනීම, විවිධ උත්සව වලට සහභාගී වීම, ප්‍රජාවගේ සංස්කෘතික උරුමයන් හා සමාජ හරයන් පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීමට කටයුතු කිරීම ආදී කරුණු

06) නීති රීති
- නිල ඇඳුම ප්‍රමිතියට සකස් කරගැනීම.
- පාසල් කාලය තුළ පාසලේ රැඳී සිටීම.
- කාල සටහනට අනුව වැඩ කිරීම.
- පාසල ආරම්භ කිරීමට පෙර පාසලට පැමිණීම.
- නායකත්වයට අවනත වීම.
- දිනපතා පාසලට පැමිණීම.

සම්ප්‍රදායන්
- පාසලේ ආගමික වතාවත් නිවැරදිව ඉටුකිරීම.
- පාසල් ගීය ගායනා කරන විට නිවැරදි ඉරියව් ප්‍රකාශ කිරීම.
- කාලයක් තුළ පැවත එන සිරිත් විරිත් අනුගමනය කිරීම.
- ගුරුවරුන්ට ගරු කිරීම
- සහෝදර සිසුන්ට උපකාර කිරීම.

(07) i.

| හරහට | පහළට |
|---|---|
| 3 - පුරවැසියන් | 1 - පරිසර |
| 4 - නර්තනය | 2 - පුස්තකාල |
| 6 - ගුරුවරු | 5 - සීරුවෙන් |
| 7 - කළහකාරී බව | 8 - කරුණාව |
| 11 - ආත්මාභිමානය | 9 - කාලය |
| | 10 - පුවත්පත් |

ii. සතුට - සිනාසීම , ඔල්වරසන් දීම, අත්පුඩිගැසීම

කෝපය - බැන වැදීම, පහරදීම, දත්මිටිකෑම

දුක - හැඬීම, සුසුම් හෙලීම, විලාපදීම

බිය - ඇස් ලොකු වීම, ශරීරය වෙව්ලීම, ගොත ගැසීම (පෙළ පොත 43 පිටුව)